**මඩුල්ල ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 06 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අගෝස්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 30 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2 මතය**

**---------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් මහජන බැංකුවේ පවත්වා තිබූ අංක 068-60-01-0000964-6 දරන ස්ථාවර තැන්පතු ගිණුම සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 09 වසා දමා රු. 1,856,944 ක ශේෂය සදොස් ලෙස ප්‍රාග්ධන ආදායම් ගිණුමට බැර කර තිබුණි. වසා තිබූ මෙම ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර තැන්පතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී අන්තර් ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ඉදිකරන ලද වාහන අංගනයේ වටිනාකම වූ රු.875,288 ක් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු. 731,969 ක විවිධ වියදම් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

ගිණුම් විෂයන් 14 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 21,169,036 ක් වූ අතර උපයෝගි ලේඛන අනුව ශේෂය රු. 21,499,392 ක් විය.

### 1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින කඩ කාමර කුලී රු. 379,179 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2006,2007,2008,2009 හා 2010 වර්ෂ 05 ක් සඳහා සභාව විසින් ගෙවිය යුතු රු. 100,672 ක විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දක්වා අයකර තිබූ එකතු කළ අගය මත බදු රු.154,816 ක් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

### 1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 90,146,165 ක වත්කම් විෂයයන් 04 ක්, රු. 246,160 ක වගකීම් විෂයයන් 01 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

1.3.5 **<u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| (i). 49 හා 52 වගන්තිය | අනුමැතියකින් තොරව ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 04 ක් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii). 152 වගන්තිය | සභා බලප්‍රදේශයේ විවිධ සමාගම් ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 04 කින් වාර්ෂික බද්දක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii). 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.2,120,859 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි. |
| (ආ) **පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය** | |
| 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය. | සභාව සතු කඩ කාමර කුලි තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2014 අයවැය යෝජනා යටතේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ ඇතුලත් 2014 මැයි 05 දිනැති අංක 1/2014 චක්‍රලේඛයේ 3 ඡේදය. | චක්‍රලේඛයෙන් දක්වා ඇති අරමුණු වලට පටහැනි ව්‍යාපෘති වෙනුවෙන් රු. 535,525 ක් වැයකර තිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,728,318 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 832,062 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 1,896,256 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 534,975 |
| මුද්දර ගාස්තු | 718,140 |

### 2.3 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ විධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයේ පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.32,697 ක මුදලක් අයකර ගැනිමට තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**
**--------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**--------------------------------**

සභාවේ සේවය කරන සේවකයින් 22 කට අදාලව 2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වු කාල පරිච්ඡේදයට අදාළව අයකරන ලද රු. 865,171 ක රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල අදාළ අරමුදලට ගෙවීම් නොකර සේවක අර්ථ සාධක අරමුදලට රු.752,446 ක් ද සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට රු.112,725 ක් ද ගෙවීම් කර තිබුණි.

04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය